ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය - දෙවන කොටස

අවසාන පරීක්ෂණය - 2007

**ESP 2468** - ප්‍රාථමික තලය සඳහා සිංහල භාෂාව

කාලය - පැය තුනයි.

---

දිනය - 2007.06.06 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

ප්‍රශ්න තුනකට <u>(03) පමණක්</u> පිළිතුරු සපයන්න.

01\. i. ළමා සිතුවිලිවලට ගැළපෙන රචනා මාතෘකා 3 ක් ලියා දක්වා එයින් එක මාතෘකාවක් යටතේ සිසුන් ලවා රචනයක් ලියන අන්දම පිළිබඳව ඔබ දක්වන ක්‍රමෝපායයන් පැහැදිළි කරන්න.

ii. ප්‍රාථමික පංතිවල සිසුන්ගේ රචනා රසවත් කිරීමට ඔබ යොදා ගනු ලබන ඉගෙනුම්-ඉගැන්වීමේ ක්‍රම පිළිබඳව නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.

iii. ප්‍රාථමික පන්තිවල දක්නට ලැබෙන රචනා දෝෂ නිදසුන් මගින් පැහැදිලි කොට ඒවා සඳහා ඔබ යොදා ගන්නා ක්‍රමෝපායයන් ලියා දක්වන්න.

02\. i. පෞද්ගලික ලිපියක් ලිවීමේදී සැලකිය යුතු ප්‍රධාන කරුණු පිළිබඳව සිසුන්ගේ අවධානය යොමු කිරීමට ඔබ යොදා ගන්නා ක්‍රමෝපායයන් පැහැදිලි කරන්න.

ii. පෞද්ගලික හා රාජකාරි ලිපියක දක්නට ලැබෙන ලක්ෂණ පිළිබඳව සිසු දරුවන්ගේ සිත් ඇඳ බැඳ තබා ගන්නා අන්දම පිළිබඳව ඔබ යොදා ගන්නා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාපිළිවෙළ දක්වන්න.

iii. පෞද්ගලික ලිපියක ලිපි කවරයෙන් කෙරෙන වැදගත් කාර්යය, ප්‍රාථමික සිසුන්ගේ සිත්වලට යොමු කිරීමට ඔබ යොදා ගන්නා ක්‍රමෝපායයන් පැහැදිලි කරන්න.

03\. i. "සිංහලයේ යෙදුම්" නිදසුන් ඇසුරින් පැහැදිලි කරමින් ඒවායේ වැදගත්කම පැහැදිලි කරන්න.

ii. ළමා මනසට ගැළපෙන ආප්තෝපදේශ 5 ක් ඇසුරින් ඒවා රසවත් අන්දමින් ළමයින්ට ලබා දීමට ඔබ ගන්නා පියවර හා ක්‍රමෝපායයන් ලියන්න.

iii. ප්‍රස්තාපිරුළු යොදා ඉතා රසවත් කතා ගෙතීමට ළමා සිත් සතන් යොමු කිරීමට ඔබ යොදා ගන්නා ක්‍රමෝපායයන් නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

04. i. ළමා කවියක් හෝ ගීතයක් ඇසුරෙන් ළමාලෝකය හා ළමා මනස පිළිබඳ විශේෂ ලක්ෂණ ගැන පැහැදිලි කිරීමට ඔබ යොදා ගන්නා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ලියා දක්වන්න.

ii. ඔබ විසින් කියවන ලද ළමා කාව්‍යවල හා ළමා ගීතවල දක්නට ලැබෙන "ළමා භාෂාවේ ලක්ෂණ" පිළිබඳව නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

iii. ළමා කවි හා ගීත රසවත් අන්දමින් ප්‍රාථමික සිසුන්ට ඉගැන්වීමට ඔබ යොදා ගන්නා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපායයන් නිදසුන් මගින් පැහැදිලි කරන්න.

05. i. ළමා කතාවක තිබිය යුතු විශේෂ ලක්ෂණ නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

ii. ළමා කතා <u>තුනක</u> නම් සඳහන් කොට ඒවායේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ නිදසුන් ඇසුරින් ලියා දක්වන්න.

iii. 'වීරකතා' භාවිතා කිරීමට හා දැනුම ලබා ගැනීමට ප්‍රාථමික පන්තිවල සිසුන්ගේ අවධානය යොමු කරවීමට ඔබ යොදා ගන්නා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපායයන් විස්තර කරන්න.

06. පහත සඳහන් ඕනෑම <u>තුනක්</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. කුඩා ළමුන් සඳහා උචිත අභිමානවත් ගීත තෝරා ගැනීම.

ii. ළමා නාට්‍යයක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ ඇසුරෙන් නිර්මාණාත්මක නාට්‍ය ලිවීමේ වැදගත්කම

iii. ළමා සිනමාව දියුණු කිරීමේ ඇති අවශ්‍යතාව

iv. වීර කතා, කාව්‍ය හා ගීතවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ

v. ළමා චින්තනය පුබුදු කිරීමට ගතයුතු ක්‍රියා මාර්ග

- හිමිකම් ඇව්රිණි. -